"ජයග්‍රහණය කෙරෙහි බුද්ධියටත් වඩා බලපාන්නේ උත්සාහය යි."

# දකුණ, සබරගමුව, ඌව, නැගෙනහිර, වයඹ, මධ්‍යම, පළාත් උපාධි ගුරු තරග විභාගය 2023

## අභියෝග්‍යතාව

අදම අපගේ අලුත්ම ප්‍රශ්න පත්‍ර සහ තොරතුරු ලබා ගැනීමට Daminda Dissanayake education Center GORVERMENT EXAM WITH DAMINDA DISSANAYAKA GROUP හිඟුම හා එක්වන්න 071-8101 600/071-7777 9177

ප්‍රවීණ දේශක හා ලේඛක :
දමින්ද දිසානායක

DD - IQ - 03

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

✱ **බ්‍රිතාන්‍යයේ වාසය කරන ශ්‍රී ලාංකික අබේරත්න, බංඩාර, චතුරංග, දයානන්ද, එරංග යන පාසල් සිසුන් පස් දෙනෙකුට ඉන්දියාව, පාකිස්ථානය, බංග්ලාදේශය, ඉන්දුනීසියාව, බුරුමය යන රටවල් පහේ අගමැතිවරුන්ගේ ඡයාරූප දී ඒවා හඳුන්වන ලෙස විධානය කරන ලදී. ඡයාරූප 1, 2, 3, 4, 5 වශයෙන් (පිළිවෙළින් නොව) අංකනය කරන ලදී. හැම ශිෂ්‍යයාම දෙකක් පමණක් නිවැරදිව හඳුනාගන්නා ලදී.**
**එමෙන්ම එක් ඡායාරූපයක් දෙදෙනෙක් බැගින් හඳුනා ගන්නා ලදී. සිසුන් කළ ප්‍රකාශ බලන්න.**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අබේරත්න | කීවේ | i. | බුරුමය | ii. | ඉන්දියාව | iii. | බංග්ලාදේශය | iv. | ඉන්දුනීසියාව | v. | පාකිස්ථානය |
| බංඩාර | කීවේ | i. | බංග්ලාදේශය | ii. | ඉන්දුනීසියාව | iii. | ඉන්දියාව | iv. | පාකිස්ථානය | v. | බුරුමය |
| චතුරංග | කීවේ | i. | ඉන්දියාව | ii. | බුරුමය | iii. | පාකිස්ථානය | iv. | ඉන්දුනීසියාව | v. | බංග්ලාදේශය |
| දයානන්ද | කීවේ | i. | බංග්ලාදේශය | ii. | ඉන්දියාව | iii. | ඉන්දුනීසියාව | iv. | බුරුමය | v. | පාකිස්ථානය |
| එරංග | කීවේ | i. | ඉන්දියාව | ii. | ඉන්දුනීසියාව | iii. | පාකිස්ථානය | iv. | බංග්ලාදේශය | v. | බුරුමය |

**01.** නො. 1 රූපය ............................................ අගමැතිගේ ය.

**02.** නො. 2 රූපය ............................................ අගමැතිගේ ය.

**03.** නො. 3 රූපය ............................................ අගමැතිගේ ය.

**04.** නො. 4 රූපය ............................................ අගමැතිගේ ය.

**05.** නො. 5 රූපය ............................................ අගමැතිගේ ය.

✱ **වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක සේවය කරන චමිලා, රාධා, ආමිනා ලිපිකාරිණියන් තිදෙනෙකි. කමල් සහ නාදන් ලිපිකරුවන් දෙදෙනෙකි. තව ද ආමිනා හා නාදන් ආධුනිකයන් ය. මොවුන් අතරින් තිදෙනෙකුගෙන් යුතු සේවක සුබ සාධක කමිටුවක් පත් කර ගැනීමට අවශ්‍යව ඇත. එහිදී වෙනත් කාන්තාවක් නැතිව කමිටුවේ සේවය කිරීමට ආමිනා අකමැතිය. ජ්‍යෙෂ්ඨතම ලිපිකරුවා වන කමල් ආධුනිකයෙකු සමඟ එකම කමිටුවේ සේවය කිරීමට අකමැතිය. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**06.** ඉහත තොරතුරු අනුව කමිටුව කී ආකාරයකට තෝරා ගත හැකි ද? (..............................)

**07.** කමිටුව තෝරා ගැනීමට අඩු ම සම්භාවිතාවක් ඇත්තේ කාට ද? (..............................)

**08.** කමිටුවට තෝරා ගැනීමට වැඩිම ප්‍රවණතාවයක් ඇත්තේ කාට ද? (..............................)

**09.** යටත් පිරිසෙයින් එක් ආධුනිකයෙක්වත් ඇතුළත් කමිටුවක් කී ආකාරයකට සැකසිය හැකි ද? (..............................)

**10.** ආධුනිකයන් එක් අයෙකුට වඩා ඇතුළත් වන කමිටුවක් කී ආකාරයකට සැකසිය හැකි ද? (..............................)

❖ **මහව කලාප අධ්‍යාපන කාර්යාලයේ ශක්ති සුහ සාධක සංගමය මගින් දිනුම් අදිනු ලැබූ ලොතරැයියේ පළමු ස්ථාන 5 දිනාගත් පුද්ගලයන් පස් දෙනා පිළිබඳව පහත සඳහන් තොරතුරු දී ඇත. ඉන් එක් තොරතුරක් අසත්‍ය වන අතර එකක් සත්‍ය වේ. එම තොරතුර හොඳින් අධ්‍යනය කර පිළිතුරු සපයන්න.**

**i.** **සුමරපාල දෙවෙනියා, සුමරවීර පළමුවෙනියා**

**ii.** **සුමරසිංහ හතරවෙනියා, සුමරවීර දෙවෙනියා**

**iii.** **සුමරසේකර තුන්වෙනියා, සුමරතුංග පස්වෙනියා**

**iv.** **සුමරවීර පස්වෙනියා, සුමරසේකර පළමුවෙනියා**

**v.** **සුමරතුංග දෙවෙනියා, සුමරවීර තුන්වැනියා**

**11.**පළමුවෙනියා කවුද? ..............................

**12.**දෙවෙනියා කවුද? ..............................

**13.**තුන්වෙනියා කවුද? ..............................

**14.** හතරවෙනියා කවුද? ..............................

**15.**පස්වෙනියා කවුද? ..............................

✸ **කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ඇගළුම් ආයතනවල ඇතිවී තිබෙන ආරවුලක් විසඳීම සඳහා නන්ද, භාරත, චන්දන හා දර්ශන යන සේවකයන් ද එරික්, ෆීලික්ස්, ජෝජ් හා හැරී යන සේවාදායකයන් ද අතුරින් තෝරා ගත් නියෝජිතයන් පස් දෙනෙකුගෙන් සැදුම් ලත් සාකච්ඡා කොමිටියක් පත් කිරීමට තීරණය කර ගන්නා ලදී.**
**කොමිටියේ සාමාජිකයන්ගෙන් තුන් දෙනෙකු සේවකයන් අතරින් විය යුතු ය. ඊට අමතර ව කොමිටියේ සාමාජිකයන් තෝරා ගැනීමේ දී මේවා ද සැලකිල්ලට ගත යුතු විය.**

❖ **නන්ද හා දර්ශන එරෙහි කම්කරු සමිතිවල සාමාජිකයන් බැවින් ඔවුන් දෙදෙනාට කොමිටියේ එකට වැඩ කළ නොහැක.**

❖. **භාරත, එරික් යටතේ සේවය කරන බැවින් ඔවුහු කොමිටියේ එකට වැඩ කිරීම ප්‍රතික්ෂේප කරති.**

❖ **ෆීලික්ස් හා ජෝජ් තරඟකාරී සමාගම් දෙකක නිසා ඔවුහු කොමිටියේ එකට වැඩ නොකරති.**

❖ **දර්ශන, ෆීලික්ස් යටතේ සේවය කරන නිසා ඔවුන් දෙදෙනාට කොමිටියේ එකට වැඩ කළ නොහැක.**

**16.** භාරත කොමිටියේ සේවය කිරීම සඳහා තෝරා ගත්තේ නම්, කොමිටියේ සේවය කිරීම සඳහා අනිවාර්යයෙන් තේරෙන අනෙක් සේවකයා කවු ද? ......................................

**17.** හැරී කොමිටියේ සේවය කිරීම සඳහා තෝරා ගත්තේ නම්, කොමිටියේ සේවය කිරීම සඳහා තේරෙන අනෙක් සේවාදායකයා කවු ද? ......................................

**18.** ජෝජ් කොමිටියේ සේවය කිරීම සඳහා තෝරා ගත්තේ නම්, කොමිටියේ සේවය කිරීම සඳහා තේරෙන සේවාදායකයා කවු ද? ......................................

**19.** ෆීලික්ස් තෝරා ගත්තේ නම්, කොමිටියේ සේවය කළ හැකි අනෙක් හතර දෙනා කවුරුන් ද?......................................

**20.** දර්ශන තෝරා ගත්තේ නම්, කොමිටියේ සේවය කළ හැකි අනෙක් හතර දෙනා කවුරුන් ද? ......................................

✸ **නාරම්මල මයුරපාද මහා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ සංවිධාන කටයුතු එහි ගුරුවර ගුරුවරියන්ට භාරදී ඇත. එහිදී සංග්‍රහ කමිටුව සඳහා ගුරුවරියන් වන ආකර්ෂා, පටාචාරා, චමිලා යන තිදෙනා සහ බුද්ධික හා සාරංග යන ගුරුවරුන් දෙදෙන අතුරින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් තෝරාගැනීමට නියමිත ය.**

❖ **ආකර්ෂා හා බුද්ධික පමණක් අවු.55ට වැඩි අය වෙති.**

❖ **ආකර්ෂා කණ්ඩායමට සම්බන්ධ වන්නේ තවත් ගුරුවරියක් සම්බන්ධවනවා නම් පමණි.**

❖ **අවු.55ට වැඩි අය සිටින කණ්ඩායමකට සම්බන්ධ වීමට අකමැති බව චමිලා ප්‍රකාශ කර ඇත.**

**21.** මේ අනුව තිදෙනෙකුගෙන් යුත් කමිටු ආකාර කීයක් සකස් කළ හැකි ද?

i. 3 ii. 4 iii. 5 iv. 6

**22.** කමිටුවට සම්බන්ධ වීමේ අවස්ථාව අඩු ම පුද්ගලය කවු ද?

i. ආකර්ෂා ii. චමිලා iii. බුද්ධික iv. එරංග

**23.** ආකර්ෂා සිටින කමිටුවට එක් විය හැකි අනෙක් දෙදෙනා වන්නේ,

i. පටාචාරා හා චමිලා හෝ බුද්ධික හා සාරංග
ii. පටාචාරා හා බුද්ධික හෝ පටාචාරා හා සාරංග
iii. පටාචාරා හා සාරංග හෝ චමිලා හා සාරංග
iv. චමිලා හා බුද්ධික හෝ පටාචාරා හා බුද්ධික

**24.** ආකර්ෂා හා බුද්ධික සිටින කමිටුව පිළිබඳ පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

අ) චමිලාට එම කමිටුවට සම්බන්ධ විය නොහැක.
ආ) පටාචාරා එම කමිටුවේ සිටිය යුතුම ය.
ඇ) චමිලා හා සාරංග යන දෙදෙනාගෙන් එක් අයෙකු එම කමිටුවට ඇතුළත් විය හැක.

i. ''අ'' පමණි
ii. ''ආ'' පමණි
iii. ''අ'' හා ''ආ'' පමණි
iv. ''අ'', ''ආ'', හා ''ඇ''

**25.** පටාචාරා හා සාරංග සිටින කමිටුවට එකතු විය හැකි පුද්ගලයින් සම්බන්ධ පූර්ණ හා නිවැරදි ලැයිස්තුව පහත සඳහන් කුමක් විය යුතු ද?

i. ආකර්ෂා
ii. ආකර්ෂා හෝ චමිලා
iii. චමිලා හෝ බුද්ධික
iv. පටාචාරා හෝ චමිලා හෝ බුද්ධික

## පසුගිය පාඩම්වලින් අපහසු ගැටලු

★ **එක් එක් ගැටලුව සඳහා ඔබේ පිළිතුර ලියන්න.**

- **කයිමන් දොරකඩ ළඟ ආරක්ෂාව සඳහා නවක හා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් 08දෙනෙක් සේවය කරති.**
- **A, C, E, F හා H ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ය.**
- **B, D හා G කණිෂ්ඨ පොලිස් නිලධාරීන් ය.**
- **A, D, F හා H උදේ මුරවල පමණක් සේවය කිරීමට කැමති ය. අන් අය උදේ හා රාත්‍රී සේවා මුර දෙකේ ම සේවය කිරීමට කැමති ය.**
- **A, D සමඟ ද C, G සමඟ ද එකට සේවය කිරීමට කැමති නැත.**
- **සඳුදා දිනවල A හා F නිවාඩු යයි.**
- **අඟහරුවාදා දිනවල A හා C නිවාඩු යයි.**
- **බදාදා දිනවල C හා E නිවාඩු යයි.**
- **බ්‍රහස්පතින්දා දිනවල E හා G නිවාඩු යයි.**
- **සිකුරාදා දිනවල G හා H නිවාඩු යයි.**
- **ඉරිදා දිනවල B, D හා F නිවාඩු යයි.**
- **සෙනසුරාදා දිනවල B, D හා H නිවාඩු යයි.**

**01.** සෙනසුරාදා උදේ වැඩ මුරය සඳහා G නමැති කණිෂ්ට නිලධාරියා සමග සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ලියන්න.

**02.** සෙනසුරාදා රාත්‍රී වැඩ මුරය සඳහා E ජ්‍යෙෂ්ඨ නිලධාරියා සමඟ යෙදවිය හැකි අනෙක් කණිෂ්ට නිලධාරියා කවු ද?

**03.** සඳුදා උදය වැඩ මුරය සඳහා G නමැති කණිෂ්ට පොලිස් නිලධාරියා සමග යෙදවිය හැකි පොලිස් නිලධාරීන් දෙදෙනා කවුරුන් ද?

**04.** ඉරිදා රාත්‍රී වැඩ මුරය සඳහා සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ලියන්න.

**05.** බදාදා උදේ වැඩ මුරය සඳහා සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තුන්දෙනා කවුරුන් ද?

✸ **අරුණ, බණ්ඩාර, චන්ද්‍රිකා, දමයන්ති, එරංග හා ෆයිසාල් යන අයදුම්කරුවන් හයදෙනා පළමුව ලිඛිත පරීක්ෂණයකට ද දෙවනුව සම්මුඛ පරීක්ෂණයකටද ඉදිරිපත් වූහ. ලිඛිත පරීක්ෂණයෙන් පස්වැනියා වූ අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේදී පළමුවැනියා විය. සම්මුඛ පරීක්ෂණයේදී පස්වැනියා වූ තැනැත්තා ලිඛිත පරීක්ෂණයේදී තුන්වැනියා විය. ලිඛිත පරීක්ෂණයේදී අන්තිමයා වූ තැනැත්තා සම්මුඛ පරීක්ෂණයේදී ද අන්තිමයා විය. ලිඛිත පරීක්ෂණයේදී පළමු වැනියා සම්මුඛ පරීක්ෂණයේදී දෙවැනියා විය. සම්මුඛ පරීක්ෂණයේදී එරංග, චන්ද්‍රිකාට ස්ථාන දෙකකින් ඉදිරියෙන් සිටියේය. ලිඛිත පරීක්ෂණයේදී තෙවෙනියාට ස්ථාන දෙකක් ඉදිරියෙන් චන්ද්‍රිකා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලැබීය. අරුණ, එරංගට පසු පසින්ද චන්ද්‍රිකාට ඉදිරියෙන් ද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලැබීය. දමයන්ති, බණ්ඩාරට ස්ථාන දෙකක් ඉදිරියෙන් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලැබීය.**

**06.** සම්මුඛ පරීක්ෂණයෙන් පළමුවැනියා කවු ද? (................................)

**07.** සම්මුඛ පරීක්ෂණයෙන් අන්තිමයා කවු ද? (................................)

**08.** ෆයිසාල් ලිඛිත පරීක්ෂණයේදී සිටියේ කීවෙනි ස්ථානයේ ද? (................................)

**09.** ලිඛිත පරීක්ෂණයෙන් අරුණ සිටියේ කී වෙනි ස්ථානයේ ද? (................................)

**10.** සම්මුඛ පරීක්ෂණයේදී දමයන්තිට වඩා ස්ථාන කීයක් ඉදිරියෙන් අරුණ සිටියේ ද? (................................)

✸ **කසුන්, නිපුන්, සුපුන් හා රසුන් යන මිතුරන් සිව්දෙනා සුරතල් බල්ලන් තුන් දෙනෙක් ද බළලුන් තුන් දෙනෙක්ද හාවුන් දෙදෙනෙක්ද ඇති කළහ. එක් අයෙකු ඇති කළේ සතුන් දෙවර්ගයකින් දෙදෙනෙකු බැගින්ය. එම සුරතල් සතුන්ට නම් තැබීමේ දී තම මිතුරන් දෙදෙනෙකුගේ නම් තැබීය. එවිට සෑම මිතුරෙකුගේම නම දෙවර්ගයක සතුන් දෙදෙනෙකුට ලැබුණි.**

- ❖ **කසුන්ගේ සතෙකුට රසුන් යන නම නොතිබිණි.**
- ❖ **සුපුන්ගේ සතෙකුට කසුන් යන නම නොතිබිණි.**
- ❖ **බළලෙකුට කසුන් යන නම නොතිබිණි.**
- ❖ **බල්ලෙකුට රසුන් යන නම නොතිබිණි.**
- ❖ **නිපුන්ට බල්ලෙක් සිටියේ නැත.**

**11.** කසුන්ට සිටියේ කවර වර්ගයේ සතුන් දෙදෙනෙක් ද? (................................)

**12.** නිපුන්ගේ සතුන් දෙදෙනාගේ නම් මොනවා ද? (................................)

**13.** හාවුන් දෙදෙනා සිටියේ කාට ද? (................................)

**14.** සුපුන්ගේ සතුන් දෙදෙනාගේ නම් මොනවා ද? (................................)

**15.** රසුන්ට සිටියේ කවර වර්ගයේ සතුන් ද? (................................)

**16.** සුපුන් යන නම් තිබුනේ කුමන සතුන්ට ද? (................................)

උසස් පෙළ කලා,වාණිජ විද්‍යා ගණිත උපාධිධාරීන් සඳහා

# වයඹ පළාත් උපාධි ගුරු

## II වන අදියර

## හඳුන්වාදීමේ දේශනය

හවස 6.00ට

සම්පූර්ණයෙන්ම නොමිලේ

ඔක් 27 සිකුරාදා හවස 6.00ට

සජීවී පන්ති සහභාගී නොවිය හැකි සිසුන්ට Recording පහසුකම ලබාදේ

| මාසය | දිනය | දවස | වේලාව | විෂය |
|---|---|---|---|---|
| ඔක්: | 29 | ඉරිදා | පෙ.ව 8.30 -12.00 | IQ |
| ඔක්: | 30 | සඳුදා | ප.ව 7.00 -10.00 | GK |
| නොවැ: | 02 | බ්‍රහස්: | ප.ව 7.00 -10.00 | IQ |
| නොවැ: | 06 | සඳුදා | ප.ව 7.00 -10.00 | GK |
| නොවැ: | 09 | බ්‍රහස්: | ප.ව 7.00 -10.00 | IQ |
| නොවැ: | 13 | සඳුදා | ප.ව 7.00 -10.00 | GK |
| නොවැ: | 16 | බ්‍රහස්: | ප.ව 7.00 -10.00 | IQ |
| නොවැ: | 20 | සඳුදා | ප.ව 7.00 -10.00 | GK |
| නොවැ: | 23 | බ්‍රහස්: | ප.ව 7.00 -10.00 | IQ |
| නොවැ: | 27 | සඳුදා | ප.ව 7.00 -10.00 | GK |
| නොවැ: | 30 | බ්‍රහස්: | ප.ව 7.00 -10.00 | IQ |

ZOOM ONLINE

තාක්ෂණය ඔස්සේ සිදු කෙරේ

පන්ති ගාස්තුව රු 2300/-

## දමින්ද දිසානායක අධ්‍යාපන කේන්ද්‍රය

Whatsapp message හා දුරකථන මඟින් විමසීම් සඳහා

076 79 15000

071 810 1600

අයදුම්පත් බාරගන්න දිනය 2023.11.13

# සබරගමුව පළාත් උපාධි ගුරු විභාගය

අ.පො.ස උසස් පෙළ හා 13 වසරක අඛණ්ඩ වැඩසටහන යටතේ වන විෂයන් සඳහා...
ප්‍රාථමික හා අ.පො.ස සාමාන්‍ය පෙළ විෂයන් සඳහා...

ඔක්: 15 ඉරිදා උදෑසන 9.00ට

ආරම්භක Online සම්මන්ත්‍රණය

සම්පූර්ණයෙන්ම නොමිලේ පැවැත්වේ

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඔක්: 17 අඟහ: | ඔක්: 20 සිකු: | ඔක්: 22 ඉරිදා | ඔක්: 24 අඟහ: | ඔක්: 27 සිකු: | ඔක්: 29 ඉරිදා | ඔක්: 31 අඟහ: |

රාත්‍රී 7.00 සිට රාත්‍රී 10.00 දක්වා

සජීවී පන්ති සහභාගි නොවිය හැකි සිසුන්ට Recording පහසුකම ලබාදේ

ඉහත දින සඳහා පන්ති ගාස්තුව රු 2000/-

## දමින්ද දිසානායක අධ්‍යාපන කේන්ද්‍රය

Whatsapp message හා දුරකථන මඟින් විමසීම් සඳහා

076 79 15000
071 810 1600

විභාගය නොවැම්බර් 18 පැවැත්වේ.

# දකුණු පළාත් 2023
# උපාධිගුරු විභාගය

අයදුම්පත් යොමු කිරීමේ
අවසාන දිනය 2023-10-24

## විභාගය අරමුණු කරගත්
# Speed Paper Class

| ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: | ඔක්: |
|---|---|---|---|---|---|---|---|---|
| 21 | 22 | 22 | 24 | 26 | 28 | 29 | 29 | 31 |
| සෙන: | ඉරිදා | ඉරිදා | අඟා: | බ්‍රහස්: | සෙන: | ඉරිදා | ඉරිදා | අඟා: |
| පෙ.ව 8.30- ප.ව 12.00 | පෙ.ව 8.30- ප.ව 12.00 | ප.ව 1.00- ප.ව 5.00 | පෙ.ව 8.30- ප.ව 12.00 | පෙ.ව 8.30- ප.ව 12.00 | පෙ.ව 8.30- ප.ව 12.00 | පෙ.ව 8.30- ප.ව 12.00 | ප.ව 1.00- ප.ව 5.00 | පෙ.ව 8.30- ප.ව 12.00 |

සීමිත කාලයක් ඇති බැවින් අදම අනුමාන ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡා කිරීමට එකතු වන්න...

පසුගිය විභාග ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡා කෙරේ. පන්ති ගාස්තුව රු 2000/-

සජීවී පන්ති සහභාගි නොවිය හැකි සිසුන්ට **Recording** පහසුකම ලබාදේ

## දමින්ද දිසානායක
## අධ්‍යාපන කේන්ද්‍රය

Whatsapp message හා
දුරකථන මඟින් විමසීම් සඳහා
076 79 15000
071 810 1600